# යෝගාචාර විඥානවාදය බිහිවීමෙහිලා මුල් බුදුසමයාගත සහ නිකායාන්තර ඉගැන්වීම්වල බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කරපික්කඩ සෝභිත හිමි**

## හැඳින්වීම

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව ධර්මය සහ විනය පිළිබඳව ඇතිවූ නොයෙක් මතවාද පදනම් කොටගෙන පසුකාලීනව සංඝ සමාජය හීනයාන, මහායාන, තන්ත්‍රයාන වශයෙන් නිකායයන්ට බෙදී ගියේ ය. මෙමඟින් ධර්මය විවිධාකාරයෙන් විග්‍රහ කිරීමටත්, විස්තර අටුවා සැපයීමටත් පසුකාලීන බෞද්ධ ආචාර්යවරු යොමු වූහ. මෙහි දී මහායානික ආචාර්යවරුන් උක්ත කාර්යය විෂයෙහි සුවිශේෂී දායකත්වයක් සපයා ඇත. මුල් බුදුසමයේ ආභාසය ලැබූ ඔවුහු එහි සාරය ගෙන, මූලික ධර්ම කරුණු නොයෙකුත් අයුරින් අර්ථ දක්වූහ. මෙසේ නිර්මාණය වූ බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායයන් අතර යෝගාචාර විඥානවාදී දර්ශනය ප්‍රමුඛ වූවකි. පසු කාලීනව නිර්මාණය වූ ස්ථවිරවාද, පුද්ගලවාද, සර්වාස්තිවාද, සෞත්‍රාන්තික, මාධ්‍යමික ආදී බෞද්ධ

දාර්ශනික සම්ප්‍රදායයන්ගේ විග්‍රහයන්ට ප්‍රතිවිරුද්ධව සහ ඇතැම් ආකල්ප සංවර්ධනය කරමින් නිර්මාණය වූ යෝගාචාර විඥානවාදී දර්ශනය ආචාර්ය මෛත්‍රීනාථයන් විසින් ආරම්භ කරන ලදුව අසංග, වසුබන්ධු වැනි ශ්‍රේෂ්ඨ ආචාර්යවරුන්ගේ අතින් පෝෂණය වූ බෞද්ධ දාර්ශනික ගුරුකුලයක් බව බොහෝ දෙනාගේ මතය යි.

දාර්ශනික වශයෙන් විඥප්තිමාත්‍රතා සංකල්පය පිළිබඳ ඉතා ගැඹුරු අදහසක් ඉදිරිපත් එකරන්නා වූ විඥානවාදීන්, ලොව ද්‍රව්‍ය සත්තාව ප්‍රතික්ෂේප කරමින් පවතින එක ම සත්‍යය ලෙස විඥානය පෙන්වා දී ඇත.[1] එසේ ම එම විඥානය ආලය, මනන, ප්‍රවෘත්ති යන ත්‍රිවිධ පරිණාමයක් ඔස්සේ ක්‍රියාත්මක වෙමින් සත්ත්වයන්ගේ සංසාර ප්‍රවෘත්තිය සිදු කරන ආකාරය යෝගාචර දර්ශනය තුළ විග්‍රහයට ලක් වී ඇත.[2]

යෝගාචාර සම්ප්‍රදායේ ප්‍රභවය පිළිබඳව විමසීමේ දී එය දීර්ඝකාලීන මතවාදයන්ගේ සහ යෝගාභ්‍යාසයන්ගේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූවකි. විශේෂයෙන් ම යෝගාචාරීහු අනෙකුත් නිකායාන්තර බෞද්ධ දාර්ශනික සංකල්ප ප්‍රතික්ෂේප කරමින් එයට පිළිතුරු ලෙස විඥප්තිමාත්‍රතා සංකල්පය සංවර්ධනය කළහ. මෙහි දී ඔවුන් ප්‍රතීත්‍යසමුප්පාද න්‍යාය ඇතුළු මූලික සූත්‍රාගත කරුණු මූලබීජ ලෙස ගෙන ස්වදාර්ශනික සංකල්පයන් පෝෂණය කොට ඇති අයුරු දක්නට ලැබේ.



## විඥානවාදය විෂයෙහි බලපෑ මුල් බුදුසමයාගත මූලික ඉගැන්වීම්

ආචාර්ය මෛත්‍රීනාථයන්ගෙන් ආරම්භව අසංග, වසුබන්ධු ආදී ආචාර්යවරුන්ගෙන් සංවර්ධනය වූ යෝගාචාර විඥානවාදී දර්ශනය "තථතා", "විඥප්තිමාත්‍රතා", "චිත්තමාත්‍රතා" සංකල්ප පදනම්ව විඥානයේ ස්වභාවය සහ එහි ක්‍රියාකාරීත්වය පෘථුලව සාකච්ඡා කරන්නා වූ දාර්ශනික විග්‍රහයකි. මෙය යෝගාචාරීන් විසින් ම නිර්මාණය කරන ලද්දක් නොවන අතර, මේ සඳහා මුල් බුදුසමය ඇතුළු නිකායාන්තර මතවාදයන් ප්‍රබලව බලපා ඇති අයුරු බොහෝ උගතුන් පෙන්වා දී ඇත. මෙහි දී විශේෂයෙන් ම යෝගාචාර දර්ශනය නිර්මාණය වීමෙහිලා මූලබීජ වූ මුල් බුදුසමයාගත කරුණු කුමක්දැයි විමසා බැලීම ඉතා වැදගත් වේ. මුල් බුදුසමය තුළ දක්නට ලැබෙන චතුරාර්ය සත්‍යය, කර්මය, පුනර්භවය, පඤ්චස්කන්ධ විභාගය, ප්‍රතීත්‍යසමුප්පාද දර්ශනය වැනි මූලික ඉගැන්වීම් පසුකාලීන බෞද්ධ දර්ශනිකයන්ගේ අවධානයට යොමු වූ සංකල්පයන් ය. මෙහි දී ඔවුන් මුල් බුදු සමයේ දක්වෙන මෙම සංකල්පයන් න්‍යායිකව, තර්කානුසාරීව, විචාරපූර්වකව එමෙන් ම සංශ්ලේෂණාත්මකව නව මුහුණුවරකින් ඉදිරිපත් කරන්නට යෙදුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුකාලීනව මෙතෙක් නිහඬව තැම්පත් ලෙස සාමකාමීව ගලාගිය මූලික බෞද්ධ දර්ශනය කැලඹීමකට පත් වූ අතර ඝෝෂා සහිතව සීඝ්‍රයෙන් සාහසික ලෙස ගලා යන්නට විය. එසේ ම මුල් බුදුසමය තුළ දක්නට ලැබෙන ඇතැම් සංකල්පයන් මෙහි දී විවේචනයට භාජනය

වූ අතර එයින් නව අදහස් රාශියක් නිර්මාණය විය. බුදුරදුන්ගේ දේශනා ක්‍රමවේදයන් අතර වූ "නිප්පරියාය" දේශනා සහ "සංඛිත්ත" දේශනාවන් තර්කානුකූලව විග්‍රහ කිරීමට යෑමේ ප්‍රතිඵලයක් ලෙස ද පසුකාලීනව මෙම දර්ශනවාදයන් බිහිවී ඇතැයි සිතිය හැකි ය.

මුල් බුදුසමයේ දක්නට ලැබෙන විඥානය සම්බන්ධ ධර්ම මාතෘකාවන් තුළ බුද්ධ භාෂිතයේ යථාභූතාර්ථය ගැබ්ව ඇති බව පෙන්වා දුන් යෝගාචාරීහු, එම මූලබීජ පාදක කොටගෙන "විඥප්තිමාත්‍රතා දර්ශනය" නිර්මාණය කළහ. යෝගාචාර සම්ප්‍රදායේ දාර්ශනික සිද්ධාන්ත විග්‍රහ කරන්නා වූ ඉතා ප්‍රකට ග්‍රන්ථයන් ලෙස විඥප්තිමාත්‍රතාසිද්ධි, යෝගාචාරභූමිශාස්ත්‍ර, ආර්යලංකාවතාර සූත්‍ර ආදී ග්‍රන්ථයන් දක්වෙන අතර මෙම සියල්ලෙහි හරය විඥප්තිමාත්‍රතාවයයි. තිමිර රෝගයෙන් පෙළෙන්නා වූ පුද්ගලයාට නොපෙනෙන්නා වූ කෙස්, සඳමඩල ආදිය පෙනේ ද, එසේම භවය, සංසාරය, ලෝකය, විශ්වය ආදී ත්‍රෛකාලීන ධාතූන්ගේ අස්තිත්වය, අස්තිත්වයක් නොව තම සිතින් තම සිත දැකීමක් පමණක් බව යෝගාචාර විඥප්තිමාත්‍රතාව යි.[3] මෙම අදහසට සමාන වූ ඉගැන්වීම් රාශියක් මුල් බුදුසමය තුළ දක්නට ලැබේ. මජ්ඣිම නිකායේ මධුපිණ්ඩික සූත්‍රය විමසා බැලීමේ දී ලෝකය පිළිබඳ පුද්ගලයා අනුභූතීන් ගොඩනගන්නා වූ අයුරු පෙන්වා දී ඇත. එහි දී ඉන්ද්‍රියානුසාරීව පුද්ගලයා අනුභූතීන් ගොඩනගන අතර, එය පසුව වෛඥානික ක්‍රියාවලියක් ඔස්සේ ප්‍රපංචකරණය දක්වා ක්‍රියාත්මක වේ. ඉන්ද්‍රියානුභූතිය උදෙසා මූලික වශයෙන් ඉන්ද්‍රියත්, අරමුණත්, ආරම්මණයත්



තිබිය යුතු අතර, ඒවා එකිනෙකට ගැටීමෙන් ස්පර්ශය ද අනතුරුව වේදනාව ද, හඳුනාගැනීම ද, එය තවදුරටත් ගැඹුරින් විමසා බැලීම ද සිදුකරන අතර ඉන්පසු ප්‍රපංචකරණය නම් වූ ගැඹුරු මානසික තත්ත්වයකට පත් වේ.[4] මෙහි දී ප්‍රපංචකරණය ලෙස විස්තර කරනු ලබන්නේ අරමුණ පිළිබඳව සිත ඇලවීම, රැඳවීම, බන්ධනයට පත්කිරීම ආදිය යි. මෙසේ ඉන්ද්‍රියානුභූතිය තුළින් පුද්ගලයා ප්‍රපංච ලෝකයට යොමුවන අතර, විඥානවාදීන් මෙම ආකල්පය පෙන්වා දෙනු ලබන්නේ විඥප්තිමාත්‍රතාවය ලෙසිනි.

අංගුත්තර නිකායේ නිබ්බේදිකපරියාය සූත්‍රය විමසා බැලීමේදී ද මෙවැනි අදහසක් දක්නට ලැබේ. මෙහි දී ලොව "කාමය" ලෙස දක්වා ඇත්තේ සංකල්ප පිළිබඳ රාගය යි. ලොව විසිතුරු තත්වයන් එසේම පවතින අතර උත්සාහවන්තයෝ ඒ විසිතුරු අරමුණු කෙරෙන් උපන් ඡන්දරාගය බැහැර කරනු ලබති.[5] නමුත් පුහුදුන් පුද්ගලයා සංකල්ප රාගයට වසඟ වී කාම ලෝකය තුළ කටයුතු කරයි. මෙහි දක්වෙන සංකල්ප රාගය යනු විඥප්තිමාත්‍රතාවයට සමාන වූවකි.

මීට අමතරව "විඥානය" පිළිබඳ මුල් බුදුසමය තුළ ඉගැන්වෙන බොහෝ අවස්ථා තුළ දී යෝගාචාර විඥානවාදී මූලබීජ දැකගත හැකි වේ. සංයුක්ත නිකායේ සගාථා වග්ග චිත්ත සූත්‍රය තුළ මුළු මහත් ලෝතලයම සිත පදනම්ව පවතින අයුරු දක්වා ඇත.[6] ආර්ය ලංකාවතාර සූත්‍රයේ ද මෙම අදහසට ම සමාන වූ අදහසක් දක්නට ලැබේ.[7] එසේම

මුල් බුදුසමය තුළ දක්නට ලැබෙන **මනො පුබ්බඞ්ගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා**[8] (සියලු ධර්මයෝ මනස පෙරටු කරගෙන ඇත. මනස ශ්‍රේෂ්ඨ කොට ඇත. මනසින් උපන්නෝ වේ.) **සෙය්‍යථාපි ගහපති පුරිසො සුපිනකං පස්සෙය්‍ය ආරාම රාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං සො පටිබුද්ධා න කිඤ්චි පස්සෙය්‍ය එව මෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසංචික්ඛති.**[9] (පුරුෂයකු ආරාමවලින් රමණීය වූ, වනයන්ගෙන් රමණීය වූ, භූමිභාගයෙන් රමණීය වූ පෙදෙසක් පිළිබඳ සිහිනෙන් දකී. හෙතෙම අවදි වී බලන විට එබඳු කිසිවක් නොදකී. එසේ ආර්ය ශ්‍රාවකයා කාමයන් පිළිබඳ නුවණින් පරීක්ෂාකර බලයි.) **දීඝරත්තං වත අහං ඉමිනා චිත්තෙන නිකතො වඤ්චිතො පලුද්ධො**[10] (සැබවින් ම බොහෝ කලක් මේ සිත මා වංචා කරන ලදී.) වැනි දේශනාවන් පිළිබඳ විමසා බැලීමේ දී මේවා යෝගාචාර විඥානවාදී දර්ශනයට මූලබීජ වන්නට ඇතැයි සිතිය හැක.

යෝගාචාර දර්ශනයේ විමුක්තිය ලෙස දැක්වෙන්නේ "තථතාව" යි. එනම් විඥානයේ ක්‍රියාකාරිත්වය නිවැරදිව අවබෝධ කොට ගැනීම යි. ආලය විඥානය, මනන විඥානය, ප්‍රවෘත්ති විඥානය නම් වූ විඥාන පරිණාම තුළින් නිර්මාණය වන්නාවූ සත්ත්වයාගේ සංසාර ප්‍රවෘත්තිය ආලය විඥානයාගේ නිරෝධය දක්වා එනම් අරහත්වය දක්වා ගමන් කරන අයුරු විඥප්තිමාත්‍රතාසිද්ධි ග්‍රන්ථය තුළ දක්නට ලැබේ.[11] මුල් බුදුසමය දෙස බලන කල ද විඥානයේ ක්‍රියාකාරිත්වය මත පුද්ගලයාගේ විමුක්තිය හෝ සාංසාරිකත්වය රඳා පවතින බව දක්වා ඇති අතර විඥානය පාරිශුද්ධත්වයට පත් කල්හි



ආශ්‍රවක්ෂය ඥානය වෙත යොමු වීමෙන් සියලු ආශ්‍රවයන්ගෙන් මිදී විමුක්තිය ලැබිය හැකි බව දේශනා කොට ඇත.[12]

විඥානවාදීහු මුල් බුදුසමයේ මූලබීජ තුළින් ස්වදර්ශනය පෝෂණය කොටගත්තා සේම මුල් බුදුසමයේ කෙටියෙන් දක්වා ඇති කරුණු දීර්ඝ වශයෙන් විස්තර කොට ඇත. පුද්ගල සංසාර ප්‍රවෘත්තිය පිළිබඳ මුල් බුදුසමයාගත ඉගැන්වීම් විමසා බැලීමේ දී සත්ත්වයා රැස් කරන්නා වූ කුසලාකුසල කර්ම ශක්තීන් භවයෙන් භවයට ගමන් කරන ආකාරය පිළිබඳ ඍජු පිළිතුරක් දක්නට නොලැබේ.

**" සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං "**

යනුවෙන් නාම - රූප ධර්ම විඥානය ප්‍රත්‍ය කොටගෙන ද, විඥානය සංඛාරය ප්‍රත්‍ය කොටගෙන ද නිර්මාණය වන බව මූලික සූත්‍ර දේශනා තුළ දක්නට ලැබුණ ද විඥානය තුළ සංඛාර හෙවත් කුශලාකුශල ශක්තීන් රැඳී පවතින බවක් එහි විග්‍රහ වී නොමැත. කුශලාකුශල ශක්තීන් වෙන ම ප්‍රවාහයක් සේ පුද්ගල භවගාමීත්වය තුළ ක්‍රියාත්මක වන ආකාරයක් ද මුල් බුදුසමයේ දක්නට නොලැබේ. මෙම කාරණාව විෂයෙහි ඍජු පිළිතුරක් විඥානවාදීහු ඉදිරිපත් කරති. ඔවුන් පුද්ගලයා විසින් නිර්මාණය කරන්නා වූ සංඛාර හෙවත් කුශලාකුශල ශක්තීන් විඥානය තුළ ම රැඳී පවතින බව දක්වන අතර, එය විඥානය මඟින් ම නිර්මාණය වී විඥානය තුළ ම ශක්ති ස්වරූපයෙන් පිහිටා නිරන්තරයෙන්

වෙනස් වෙමින්, මුහුකුරා යමින්, ඵලවත් වී පුද්ගල භවගාමිත්වය තුළ ක්‍රියාත්මක වන බව දක්වා ඇත.[13] මෙහි දී ඔවුන් කිසිවිටෙක ආත්මවාදයක් අර්ථවත් නොකරන අතර ප්‍රතීත්‍යසමුප්පාද න්‍යාය ද ආරක්‍ෂා කොට ඇත.[14]

මෙසේ සංඛාරයත්, විඥානයත් අඛණ්ඩ ප්‍රවාහයක් සේ ඉදිරියට ගලා යන අයුරු පෙන්වා දෙන විඥානවාදීහු මෙහි කර්මබීජ හෙවත් වාසනා ශක්තිය ක්‍රියාත්මක වන විඥානමය අවස්ථාව ''ආලය විඥානය'' ලෙස හඳුන්වති. ආලය විඥානයේ නිරෝධයක් ඇත. එනම් තථතාව යි. ඓතිහාසික වශයෙන් '' ආලය '' යන පදය යෝගාචාරීන්ගේ ම නිර්මාණයක් නොවේ, එය පාරිභාෂික අර්ථයෙන් මුල් බුදුසමයේ ඇතැම් දේශනා තුළ දක්නට ඇත. සුත්තනිපාතයේ බුදුන් වහන්සේ කාම ආලයෙහි නොඇලුණු තැනැත්තෙකැයි සාතාගිරට පැවසූ අවස්ථාවක් දක්නට ලැබේ.[15] මෙහි ආලය යන පදය තුළින් '' ක්ලේෂ '' යන අර්ථය දක්වා ඇති බව පෙනේ. මීට අමතරව ''යමෙක් තුළ ආලයෝ නොදිස් වෙත් නම් ඔහු බමුණෙක් යැයි කියමි.'' යන සුත්තනිපාත දේශනාව තුළ ද ආලය යන වචන මඟින් ක්ලේෂ යන අර්ථ දක්වා ඇත.

අංගුත්තර නිකාය තුළ සාමාන්‍ය පුහුදුන් පුද්ගලයෙකුගේ ස්වභාවය විස්තර කරනුයේ **ආලය රාමා, ආලය රතා, ආලය සමුදිතා** යන විශේෂණ පදවලිනි.[16] එසේ ම මජ්ඣිමනිකාය තුළ ද **ඡන්ද, අනුසය, අජ්ඣෝසාන** යන පදයන්ට පර්යායව ආලය යන්න යෙදී ඇති අයුරු දක්නට ලැබේ.[17] ආලය යන පදයේ විරුද්ධාර්ථය '' අනාලය '' යන්න



යි. සංයුත්ත නිකාය තුළ රාග, දෝස, මෝහ දුරු කොට නිර්වාණගාමී මාර්ගයට යොමු වීම අනාලය ලෙස දක්වා ඇත.[18]

මෙසේ මුල් බුදුසමය තුළ දක්නට ලැබෙන ආලය යන්න යෝගාචාරීන්ගේ ආලය විඥානයට සමාන වූවක් ලෙස දැක්විය හැකි ය. යෝගාචාරීන්ට අනුව ආලය විඥානය තුළ කර්ම බීජ, ක්ලේෂ බීජ, වාසනා බීජ තැම්පත්ව ඇත.[19] මුල් බුදුසමයේ ද ක්ලේෂ බීජ තැම්පත්ව පවත්නා අවස්ථාවක් දක්නට ලැබේ.[20]

යෝගාචාර දර්ශනයේ විමුක්තිය ලෙස දක්වන්නේ ආලය විඥානයාගේ නිරෝධය යි. එය '' අර්හත්වය '' නම් වූ කර්ම බීජ, ක්ලේෂ බීජ, වාසනා බීජ ප්‍රහානය තුළින් අර්ථවත් වේ.[21] මුල් බුදුසමයේ ද විමුක්තිය ලෙස දක්වන්නේ සංඛාර විඥානයෙන් නිරෝධයට පත් කරලීම යි. වෛඥානික ත්‍රිවිධ පරිණාමය තුළ දැක්වෙන '' මනන විඥානය '' ආලය විඥානයට ප්‍රතිබද්ධ වූවකි. එය තුළ ආත්ම දෘෂ්ටි, ආත්ම මෝහ, ආත්ම මාන, ආත්ම ස්නේහ, යන චතුර්විධ ක්ලේශයන් තැම්පත්ව ඇත.[22] ආලය විඥානයේ කැළඹීමත්, මනන විඥානයේ ක්‍රියාකාරිත්වයත් පදනම්ව සත්වයා ප්‍රපංච ලෝකයක් නිර්මාණය කරනු ලබයි. මජ්ඣිම නිකායේ මධුපිණ්ඩික සූත්‍රය තුළ ද මෙයට සමාන වූ වෛඥානික ක්‍රියාවලියක් දක්නට ලැබේ.[23] එහි දැක්වෙන ප්‍රපංචකරණය නම් වූ ගැඹුරු මානසික අවස්ථාව ආලය විඥානයට සමාන වන අතර ඵස්ස, වේදනා, සඤ්ඤා, විතක්ක යන විඥාන

ක්‍රියාකාරිත්වය මනන විඥානයට සමාන වේ. ත්‍රිවිධ පරිණාම තුළ දක්නට ලැබෙන ප්‍රවෘත්ති විඥානය ද මුල් බුදුසමයේ "චක්ඛු විඤ්ඤාණ" ආදී වූ ඉන්ද්‍රිය විඤ්ඤාණයට සමාන වූවකි. මීට අමතරව විඥානවාදීන්ගේ ආලය විඥාන සංකල්පය ප්‍රභවය වීමට බොහෝ සෙයින් පාදක වන්නට ඇතැයි සිතිය හැකි ඉගැන්වීමක් දීඝ නිකායේ කේවඩ්ඩ සූත්‍රය තුළ දක්නට ලැබේ.[24] විඥානවාදීහු එකම සත්‍යය වූ, අනිර්වචනීය වූ, අව්‍යාජ වූ පරම පදාර්ථය ලෙස "විඥානය" දක්වන අතර මුල් බුදුසමය තුළ ද "විඥානය ඇසින් නොදැකිය හැකි ය. එබැවින් අනිදර්ශන ය. එහි අන්ත රහිත ය. එනම් උප්පාද, වය නැත. එබැවින් අනන්ත ය. මෙහි පෘථිවි, ආපෝ, තේජෝ, වායෝ, ධාතු නොපිහිටයි. මෙහි දික් වූ ද, කෙටි වූ ද, කුඩා වූ ද, මහත් වූ ද, සුභ වූ ද, අසුභ වූ ද නාම රූපයෝ ඉතිරි නොවී නිරුද්ධ වෙති. විඥානයාගේ නිරෝධයෙන් නිවනට පැමිණ මේ සියල්ලම නිරුද්ධ වෙයි." යනුවෙන් පෙන්වා දී ඇත.

මෙසේ සමස්තයක් ලෙස විමසා බැලීමේ දී යෝගාචාර විඥානවාදය බිහිවීමට මුල් බුදුසමයේ මූල බීජ ප්‍රබලව බලපා ඇති අයුරු දක්නට ලැබේ. යෝගාචාරීහු මුල් බුදුසමයේ "විඤ්ඤාණය" සම්බන්ධ දේශනා රැස් කොට එම අදහස් නව මුහුණුවරකින් ඉදිරිපත් කොට ඇති අතර මෙහි දී ඔවුන් නිරන්තරයෙන් මූලික බුද්ධ න්‍යාය මත පිහිටා කටයුතු කිරීමට උත්සාහ ගෙන ඇත.



## විඥානවාදය බිහිවීමෙහිලා නිකායාන්තර බුදුසමයේ බලපෑම

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව ක්‍රමයෙන් සංඝ සමාජය තුළ ධර්ම විනය සම්බන්ධයෙන් නොයෙකුත් මතවාදයන් බිහි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුකාලීනව නොයෙකුත් නිකායයන් සංඝ සමාජය තුළ ආරම්භ වූ අයුරු දක්නට ලැබේ. සමස්තයක් ලෙස බොහෝ නිකායයන් නිර්මාණය වීමට දාර්ශනික වශයෙන් බලපෑ කරුණක් විය. එනම් බාහිර ලෝකය සහ සත්වයාගේ පැවැත්ම පිළිබඳ ඒකමතික වූ අදහසක් සංඝ සමාජය තුළ නොතිබීම යි. මෙම කාරණාව විෂයෙහි

- ස්ථවිරවාද
- පුද්ගලවාද
- සර්වාස්තිවාද
- සෞත්‍රාන්තික
- මධ්‍යමක

යන බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායයන් විවිධාකාර වූ අදහස් දැරූ අතර යෝගාචාර විඥානවාදී බෞද්ධ දාර්ශනික සම්ප්‍රදාය නිර්මාණය වීමෙහිලා උක්ත නිකායාන්තර මතභේදයන් ප්‍රබලව බලපා ඇති අයුරු දක්නට ලැබේ.

## ස්ථවිරවාදය

ස්ථවිරවාද හෙවත් ථෙරවාදය තුළ සත්ව, පුද්ගල, ලෝක ආදී සියල්ල හැඳින්වීම සඳහා සබ්බ, ලෝක, ධම්ම, සංඛාර ආදී පර්යාය පදයන් භාවිත කරනු ලබන අතර මේවායේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ තුනක් පෙන්වා දෙයි.

01. උප්පාදක්ඛණ
02. ඨිතික්ඛණ
03. භංගක්ඛණ[25]

"උප්පාදක්ඛණය" යනු ධර්මයන්ගේ පහළ වන අවස්ථාව යි. "ඨිතික්ඛණය" යනු එම ධර්මයන්ගේ පවතින කාලය යි. "භංගක්ඛණය" යනු විනාශ වන අවස්ථාව යි. මෙම විවරණයට අනුව ථෙරවාදීන් ඨිතික්ඛණ වශයෙන් ධර්මයේ පැවැත්ම අර්ථවත් කොට ඇත. එම නිසා ථෙරවාදය සත්වාදී දර්ශනයක් ලෙස දැක්වේ. මුල් බුදුසමය තුළ ධර්මයෙහි පැවැත්ම පිළිබඳ දක්වා ඇති **"උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති"**[26] යන අවස්ථා අතර "ඨිතස්ස අඤ්ඤථත්ථ" හෙවත් ධර්මය තිබූ ස්වරූපයෙන් වෙනත් ස්වරූපයකට පත්වීම ථෙරවාදයේ "ඨිතක්ඛණ" අවස්ථාවට සමාන වන අයුරු අංගුත්තර නිකාය අටුවාවේ[27] සහ විශුද්ධිමාර්ගයෙහි ථෙරවාදීන් විසින් පෙන්වා දී ඇත. මෙම විවරණයන්ට අනුව



ධර්මයේ ඉපදීමත් නිරෝධයත් අතර කාලය ඨිතික්ඛණ නම් වේ. මෙම අවස්ථාව බාහිර ලෝකය පිළිබඳ ප්‍රත්‍යක්ෂය ලබාගැනීම සඳහා ඉවහල් වේ. ප්‍රත්‍යක්ෂය මානසික ක්‍රියාවකි. එසේ ම ප්‍රත්‍යක්ෂයට විෂය වන්නා වූ අරමුණ භෞතික ය. ථෙරවාදී සම්ප්‍රදායට අනුව චිත්තක්ෂණයට වඩා රූපක්ෂණය දීර්ඝ ය. රූපය පවතින එක් ක්ෂණයක දී චිත්තක්ෂණ දහසයක් ඉපිද නැතිවී යයි. රූපය චිත්තයාගේ දාහත්වන ක්ෂණයේ දී සිඳී යයි.[28] මෙසේ චිත්තක්ෂණයට වඩා රූපක්ෂණය දීර්ඝ වන බැවින් බාහිර ලෝකය පිළිබඳ ප්‍රත්‍යක්ෂය ථෙරවාදීහු පිළිගනිති. ඔවුන් එය "බාහ්‍යාර්ථප්‍රත්‍යක්ෂවාදය" ලෙස දක්වා ඇත. යෝගාචාර විඥානවාදීහු මෙම අදහස නොපිළිගනිති. මෙයට ප්‍රතිවිරුද්ධ වූ අදහසක් දැක්වීම සඳහා ඔවුන් විසින් විඥානවාදය නිර්මාණය කරන්නට ඇත.

ථෙරවාදීහු බාහිර ලෝක ප්‍රත්‍යක්ෂය තුළ ද්විසත්‍යවාදයක් ඉදිරිපත් කරති. එනම් සම්මුතිය සහ පරමාර්ථය යි.[29] සම්මුතිය යනු බාහිර ලෝකය තුළ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වන සත්ත්ව, පුද්ගල ආදිය යි.[30] මෙයින් ලොව යථාර්ථය අර්ථවත් නොවන අතර හුදෙක් පුද්ගලයා තම සිත තුළ මවාගන්නා වූ ලෝකය සම්මුතියක් පමණක් බව දැක්වේ.[31] මෙම ථෙරවාදී අදහස යෝගාචාරීන් විඥප්තිමාත්‍රතාවයක් දක්වා සංවර්ධනය කරන්නට ඇතැයි සිතිය හැක. පරමාර්ථ සත්‍ය ලෙස ථෙරවාදීන් පෙන්වා දෙනුයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ස්කන්ධ, ධාතු, ආයතනාදී ධර්මයෝ ය.[32] මේ තුළ ලොව යථාර්ථය පිළිබිඹු වේ.[33]

පරමාර්ථ සත්‍ය තුළින් ථෙරවාදීන් ධර්මයන්ගේ පැවැත්ම අර්ථවත් කොට ඇත. මෙසේ ථෙරවාද සම්ප්‍රදාය තුළ ආත්මාවරණය බැහැර කරනු ලබන අතර ධර්මාවරණය පරමාර්ථ සත්‍යය ලෙස දක්වයි. නමුත් යෝගාචාර විඥානවාදීහු මෙම ආත්මාවරණය පමණක් නොව ධර්මාවරණය ද ප්‍රතික්ෂේප කරති.[34]

පුද්ගල සංසාර ප්‍රවෘත්තිය පිළිබඳ විමසා බැලීමේ දී ථෙරවාදී අදහස් යෝගාචාරීන් විසින් විධිමත් අයුරින් සංවර්ධනය කොට ඇති අයුරු දක්නට ලැබේ. විඥානවාදය තුළ දක්නට ලැබෙන ආලය විඥානයාගේ ක්‍රියාකාරීත්වය ථෙරවාද "භවංග චිත්තයට" සමාන වූවකි. සසර තුළ ප්‍රතීත්‍යසමුප්පන්නව නොසිඳී ගමන් කරන්නා වූ විඥාන ධාරාව "ආලය විඥානය" ලෙස යෝගාචාරීන් දක්වන අතර ථෙරවාදී භවංග චිත්තය ද මෙසේ නොසිඳ සංසාර ප්‍රවෘත්තිය සිදු කරන කාරකය ලෙස දක්වා ඇත.[35] විසුද්ධිමාර්ගය ද මෙම අදහස ඉස්මතු කරයි. එහි දී ගංගා ශ්‍රෝතයක් මෙන් වේගයෙන් ඇදී යන භවංග චිත්තය තුළ සිදීමක් අර්ථවත් නොකරයි.[36] භවංග චිත්තය සසර තුළ කවර අරමුණක් මත රඳා පවතින්නේදැයි විමසා බැලීමේ දී එය ප්‍රතිසන්ධි විඥානයට පදනම් වන්නා වූ කර්ම, කර්ම නිමිති, ගති නිමිති ආශ්‍රය කොට ගෙන පවතින බව දක්වා ඇත.[37] ප්‍රතිසන්ධි විඥානයෙන් අනතුරුව එම ප්‍රතිසන්ධි විඥානය අනුව යන **"ප්‍රතිසන්ධි විඤ්ඤාණමනුබන්ධමානං"** එම කර්මයාගේම විපාක භූත වූ **"තස්ස තස්සෙව කම්මස්ස විපාක භූතං"** එම අරමුණෙන් ම යුක්ත වූ **"තස්මිං යෙව ආරම්මණෙ"** භවංග



සිතක් පහළ වේ. මෙහි කෙළවර ලෙස ථෙරවාදීන් ද දක්වන්නේ අරහත්වය යි. මෙසේ බාහිර ලෝක ප්‍රත්‍යක්ෂය, සංසාර ප්‍රවෘත්තිය ආදී ථෙරවාදී ධර්ම විග්‍රහයන් දෙස බැලීමේ දී එම විග්‍රහයන් යෝගාචාර විඥානවාදී දර්ශනයට බලපෑම් සිදු කොට ඇති අයුරු පෙනී යයි.

## පුද්ගලවාදය

යෝගාචාර විඥානවාදය බිහිවීමෙහිලා පුද්ගලවාදය ප්‍රබල බලපෑමක් සිදු කළ ආකාරයක් මූලාශ්‍රය තුළ දක්නට නොලැබේ. යෝගාචාර විඥානවාදය විඥප්තිමාත්‍රතාවය මත නිර්මාණය වන අතර ඒ තුළින් ආනුභවික විෂය වස්තූන්ගේ පැවැත්මේ ස්වභාවය නිරූපණය කරයි. පුද්ගලවාදය තුළ ආනුභවික විෂය වස්තූන් පිළිබඳව පුළුල් විග්‍රහයක් දක්නට නොලැබේ. නමුත් පඤ්චස්කන්ධයට අමතරව පුද්ගලවාදීන් දක්වන "පුද්ගල සංකල්පය" විඥානවාදී ප්‍රවණතාවයක් ඉස්මතු කරන්නක් බව පෙනී යයි. මුල් බුදුසමයේ ඉගැන්වීම වූයේ ආනුභවික පුද්ගලයා කෙරෙහි මෙන්ම සකල ලෝක විෂයෙහි ද පඤ්චස්කන්ධයට අමතරව කිසිවක් නොමැති බව යි. නමුත් පුද්ගලවාදීන් පඤ්චස්ඛන්ධයට අමතරව පුද්ගලයෙකු ඇත යන මතය ඉදිරිපත් කළ අතර මේ සඳහා ඔවුන් පෙළ දහමේ මූලබීජ ගෙනහැර දැක්වූහ.[38] පුද්ගලවාදීන් මෙම අදහස ඉදිරිපත් කරන්නට යෙදුණේ පුනරුත්පත්තිය, කර්ම විපාක, මරණින් මතු පුද්ගලයාගේ සදාචාර වගකීම, පාරමිතා පූරණය ආදී වැදගත් ධර්ම කරුණු බුද්ධිගෝචර

අයුරින් පැහැදිලි කිරීම සඳහා ය. ඔවුන් දක්වන පුද්ගල සංකල්පය අවක්තව්‍ය, අනිර්වචනීය, අනභිලාප්‍ය තත්ත්වයක් වන අතර එය අනුභූතියට හසු නොවන්නකි. එසේ ම පාරභෞතික සංකල්ප ගණයට අයත් වූවකි. මෙම විග්‍රහය දෙස බලන කල පුද්ගල විමුක්තිය දක්වා සසර පුරාවට කුශලාකුශල කර්ම ශක්තීන් රැගෙන යන්නා වූ මානසික පදාර්ථයක් ලෙස පුද්ගලවාදීන් මෙම ''පුද්ගල සංකල්පය'' විග්‍රහ කරන අයුරු පෙනී යයි. නමුත් මෙම ඉගැන්වීම ආත්මවාදයට ඇතුළත් නොවන්නක් බව ඔවුහු නිරන්තරයෙන් පෙන්වා දුන්හ. පුද්ගලවාදීන්ගේ මෙම අදහස යෝගාචාර නිකායේ ආලය විඥානයට පදනම් වූවකි. ආලය විඥානය යනු ද සත්ත්වයාගේ කුශලාකුශල කර්ම ශක්තීන් සසර පුරාවට රැගෙන යන්නා වූ මානසික ශක්තියකි. එය ද ආත්මීය ස්වරූපයෙන් තොර වූවක් ලෙස විග්‍රහ වේ. මේ ආකාරයට පුද්ගලවාදීන්ගේ දාර්ශනික සංකල්පය යෝගාචාර සම්ප්‍රදාය විෂයෙහි බලපාන්නට ඇතැයි සිතිය හැක.

## සර්වාස්තිවාදය

යෝගාචාර විඥානවාදය බිහිවීමෙහිලා ප්‍රබල බලපෑමක් සිදු කළ බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායක් ලෙස සර්වාස්තිවාදය දැක්වේ. සත්වාදී ආකල්පයක් සෘජුව දරන්නා වූ මෙහි මූලික ඉගැන්වීම වූයේ ත්‍රෛකාලීන ධර්ම අස්තිත්වය යි.[39] මෙය මූලික සූත්‍රාගත දේශනාවන්ට ප්‍රතිවිරුද්ධ වූවකි. අනිත්‍යතා සිද්ධාන්තය පදනම් වූ මුල් බුදුසමය සියලු ධර්මයන්ගේ අනිත්‍යතාව නිරන්තරයෙන් අවධාරණය කොට



ඇත. මෙයට පිළිතුරක් ලෙස සර්වාස්තිවාදීහු ධර්මයන්හි පැවැත්ම පිළිබඳ ප්‍රධාන ලක්ෂණ දෙකක් පෙන්වා දෙති.[40]

01. ස්වභාව ලක්ෂණය
02. සාමාන්‍ය ලක්ෂණය

ස්වභාව ලක්ෂණය යනු ධර්මයන්ගේ නොවෙනස් වන්නා වූ පදාර්ථය යි. මෙය අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයෙහි ම වෙනසකට භාජනය නොවේ. මෙම මතය තහවුරු කිරීම සඳහා සර්වාස්තිවාදීහු ධර්ම විෂයෙහි සාශ්‍රව සහ අනාශ්‍රව යනුවෙන් අවස්ථා දෙකක් දක්වති. සාශ්‍රව යනු සංස්කෘත ධර්ම යි. අනාශ්‍රව යනු අසංස්කෘත ධර්ම යි. සංස්කෘත යන්නෙන් හේතු ප්‍රත්‍යව හටගන්නා වූ සියල්ල අර්ථවත් වන අතර මෙයින් අතීත කාලික ධර්ම අස්තිත්වයක් හඟවයි. ''කෘත'' යනු අතීත කාලික කෘදන්ත පදයකි. නමුත් මෙය තුළින් වර්තමාන, අනාගත කාලික ධර්ම අස්තිත්වයක් ද හැඟවේ. ''දුග්ධ'' යනු දොවන ලද කිරි හෙවත් කිරි යන්නට අපර නාමයකි. මෙයින් අතීත කාලික අදහසක් අර්ථවත් වූව ද, දෙවීමට පෙර පයෝධර වූවේ ද, දෙවූ අවස්ථාවේ දී කිරි වූවේ ද, දෙවූ පසු කිරි වූවේ ද එක ම පදාර්ථය යි. මෙම තර්කානුකූල පදනම මත ත්‍රෛකාලීන ධර්ම අස්තිත්වය පෙන්වා දෙන සර්වාස්තිවාදීන් ස්වමතය තහවුරු කිරීම උදෙසා භාවාන්‍යතාවාද, අවස්ථාන්‍යතාවාද, ලක්ෂණාන්‍යතාවාද, අන්‍යථාන්‍යතාවාද යනුවෙන් මතවාද සතරක් දක්වා ඇත.

සර්වාස්තිවාදී සම්ප්‍රදාය තුළ දක්වෙන ධර්ම අස්තිත්වය යෝගාචාර විඥානවාදීහු සම්පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප කරති. මේ පිළිබඳ ස්වමතය ඉදිරිපත් කිරීම සඳහා ඔවුන් විඥප්තිමාත්‍රතා සංකල්පය නිර්මාණය කොට ඇත. විශේෂයෙන් ම පුද්ගල නෛරාත්මය මෙන් ම ධර්ම නෛරාත්මය ද යෝගාචාර දර්ශනයෙහි මුඛ්‍ය වූ ඉගැන්වීමක් ලෙස සඳහන් වේ.

සර්වාස්තිවාදීහු ධර්ම පිළිබඳ සාමාන්‍ය ලක්ෂණයක් ද පෙන්වා දෙති. මෙයට අනුව සියලු ධර්ම අවස්ථා 04 ක් නියෝජනය කරනු ලබයි.

01. ජාති - හටගැනීම
02. ස්ථිති - පැවැත්ම
03. ජරා - විනාශමුඛ වීම
04. වය - විනාශය

මේ විග්‍රහයට අනුව ධර්මයක හටගැනීමක් ද, එහි පැවැත්මක් ද, විනාශයට යොමුවන අවස්ථාවක් ද, විනාශය ද දක්වේ. මෙහි දී මුල් බුදුසමයේ දක්වූ **"ඨිතස්ස අඤ්ඤථත්තං"** සහ ථෙරවාදී ඨිතික්ඛණ, අවස්ථාව ද සර්වසතිවාදීහු ස්ථිති, ජරා වශයෙන් අවස්ථා දෙකක් තුළ පෙන්වා දී ඇත. මෙහි ඇති "ස්ථිති" අවස්ථාව මඟින් ධර්මයේ ඍජු පැවැත්මක් අර්ථවත් වන අතර එම අවස්ථාව තුළ පුද්ගලයා ධර්මයන් පිළිබඳ ප්‍රත්‍යක්ෂය නිර්මාණය කරගන්නා බව සර්වාස්තිවාදීහු දක්වති. මෙය **"බාහ්‍යාර්ථප්‍රත්‍යක්ෂවාදය"** නම් වේ. යෝගාචාර



විඥානවාදීන් මෙම විග්‍රහය ද ප්‍රතික්ෂේප කොට ඇත. ඔවුන්ගේ මතයට අනුව ලොව සත් වශයෙන් කිසිඳු ධර්මයක් විද්‍යමාන නොවන අතර සියල්ල චිත්තමාත්‍රතාවක් පමණි.

එමෙන් ම සර්වාස්තිවාදයේ මෙන් ම ථෙරවාදයේ ද දක්වෙන ඉන්ද්‍රිය සංජනන ක්‍රියාවලිය, ක්ෂණයක් තුළ කෙසේ සිදුවේද යන ගැටලුවේ දී මෙම සම්ප්‍රදායයන් දක්වන "භවාංග චිත්ත සංකල්පය" අඛණ්ඩ විඥාන ධාරාවක් ලෙස දක්වේ. මෙම අදහස යෝගාචාර විඥානවාදී දර්ශනයේ ආලය විඥානයට සමාන වූවකි. එබැවින් යෝගාචාරීහු සර්වාස්තිවාදී ආකල්ප ප්‍රතික්ෂේප කරන්නා සේ ම එහි මූල බීජ ස්වදර්ශනය පෝෂණයෙහිලා රැගෙන ඇති බව පෙනී යයි.

## සෞත්‍රාන්තික නිකාය

මූලික සූත්‍ර දේශනා ප්‍රාමාණිකත්වයෙන් ගෙන කරුණු දක්වූවෝ සෞත්‍රාන්තිකයෝ වූහ.[41] ඔවුහු ධර්ම විෂයෙහි අවස්ථා දෙකක් පමණක් දක්වති. එනම්,

01. උප්පාද - ඉපදීම
02. වය - විනාශය

මෙම ඉගැන්වීම විෂයෙහි ඔවුන් මූලික සූත්‍රාගත මූල බීජ ඉදිරිපත් කොට ඇත.[42] මෙසේ ධර්මයන්ගේ ඉපදීම සහ විනාශය පමණක් පෙන්වා දෙන සෞත්‍රාන්තික සම්ප්‍රදාය සියලු ධර්ම ක්ෂණයක් තුළ ඉපදී එම ක්ෂණය තුළ ම විනාශ වී

යන බව දක්වමින් ක්‍ෂණවාදයක් නිර්මාණය කළේ ය.[43] මෙම ක්‍ෂණවාදයට අනුව සියලු ධර්ම ක්‍ෂණයක් තුළ ඉපිද නිරෝධයට පත් වේ නම් එම ධර්මයන් පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය කෙසේ ලබන්නේදැයි යන ගැටළුවට සෞත්‍රාන්තික පිළිතුර වූයේ සියලු ධර්ම අනුමානය තුළින් ප්‍රත්‍යක්‍ෂ කරගන්නා බව යි. ඉන්ද්‍රිය ද සිත ද ක්‍ෂණික වන බැවින් සිත දැනීම ලබන ක්‍ෂණය වන විට ඉන්ද්‍රිය තුළින් ලබන්නා වූ අරමුණ නැතිවී ගොස් ය. එබැවින් කිසිදින කිසිවෙකුට බාහිර ලොව ප්‍රත්‍යක්‍ෂ කරගත නොහැකි ය. ප්‍රත්‍යක්‍ෂයක් නොමැත. ඇත්තේ අනුමානයක් පමණි. මෙය සෞත්‍රාන්තිකයෝ ''බාහ්‍යාර්ථඅනුමේයවාදය'' ලෙස දැක්වූහ. මෙම ඉගැන්වීම මානසික ක්‍රියාවලියකි. පුද්ගලයා ඉන්ද්‍රිය මඟින් අරමුණු පිළිබඳ සංඥාව ලබා ගනී. විෂය වන්නේ සංඥාව පමණකි. මෙහි දී අරමුණු අතීතයට ගොස් හමාර ය. එබැවින් විෂය වූ සංඥාව මඟින් අරමුණු අනුමාන කරනු ලබයි.

සෞත්‍රාන්තික බාහ්‍යාර්ථ අනුමේයවාදය යෝගාචාර විඥානවාදී විඥප්තිමාත්‍රතා සංකල්පය විෂයෙහි ප්‍රබලව බලපා ඇති සාධකයක් ලෙස පෙනී යයි. අනුමේයවාදය තුළින් බාහිර විෂයවස්තු පිළිබඳ මානසික පරිකල්පනයක් මිස, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂයක් අර්ථවත් නොවේ. එසේ ම එම මානසික පරිකල්පනය ද ඍජු ප්‍රත්‍යක්‍ෂයක් නොව අනුමානයකි. අනුමානය තුළින් ප්‍රත්‍යක්‍ෂය ලබන විට අරමුණ ද අභාවයට ගොස් හමාර ය. මෙම දාර්ශනික සංකල්පයෙහි අභ්‍යාසය තුළින් යෝගාචාරීන් එය, විඥප්තිමාත්‍රතාවයක් දක්වා සංවර්ධනය කරන්නට ඇතැයි සිතිය හැකි ය.



සෞත්‍රාන්තික නිකාය බාහිර විෂය වස්තු ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ අනුමේයවාදයක් ඉදිරිපත් කළ ද එය, සර්වාස්තිවාදය මෙන් ම සත්වාදී ස්ථාවරයක පිහිටා ඇත. ස්වලක්‍ෂණමය වූ ධර්මස්වභාවය වාස්තවික සත්‍යයක් ලෙස ඔවුන් ද පිළිගෙන ඇත. එහි ප්‍රත්‍යක්‍ෂය පමණක් අනුමානය මඟින් සිදු කෙරේ. මෙය විඥානවාදී දර්ශනයට ප්‍රතිවිරුද්ධ වූවකි. යෝගාචාරීහු විඥප්තිමාත්‍රතා සංකල්පය තුළින් සෞත්‍රාන්තික සහ සර්වාස්තිවාදී සත්වාද දර්ශනය ප්‍රතික්‍ෂේප කරති.

### මධ්‍යමක නිකාය

මහායාන සම්ප්‍රදායට අයත් මධ්‍යමක දර්ශනයත්, යෝගාචාර විඥානවාදයත් බොහෝ සංකල්ප විෂයෙහි සමානත්වයක් දරයි. ශූන්‍යතාවාදී දර්ශනයක් ඉදිරිපත් කරන්නා වූ ඔවුහු, සර්වාසතිවාදී හා සෞත්‍රාන්තික සම්ප්‍රදායයන් ද ධර්ම විෂයෙහි දැක් වූ වාස්තවිකත්වය මෙන් ම වෛඥානිකත්වය යන අංශ ප්‍රතික්‍ෂේප කොට ආදි බුදු දහමෙහි දැක්වෙන ප්‍රතීත්‍යසමුත්පාද න්‍යාය තුළින් ගොඩනගා ගත් සර්ව ශූන්‍යතාවයක් මධ්‍යමකයෝ පෙන්වා දුන්හ.[44] ශූන්‍යතාවාදයට අනුව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය තුළ ගොඩනැගෙන්නා වූ සියලු භාවයන් ස්වභාව වශයෙන් ප්‍රතිබිම්භ හා සමාන ය.[45] එය මායාවක්, සිහිනයක්, ගාන්ධර්ව නගරයක් සේ උපමා කොට ඇත.[46] මෙම මධ්‍යමක ඉගැන්වීම පුද්ගල නෛරාත්මය මෙන් ම, ධර්ම නෛරාත්මය ද තහවුරු

කරගන්නකි. යෝගාචාර විඥානවාදි ඉගැන්වීම තුළ ද තහවුරු වන්නේ මෙම ඉගැන්වීම යි.

මධ්‍යමකයන් ප්‍රතීත්‍යසමුප්පාද න්‍යාය මත පුද්ගල මෙන් ම ධර්ම නෛරාත්මය පෙන්වාදීමේ දී විඥානය ද ශූන්‍යතාවාදී සංකල්පයක් ලෙස දක්වා ඇත. නමුත් යෝගාචාරීහු මෙම අදහස ප්‍රතික්ෂේප කරති. ලොව සියලු ධර්ම ශූන්‍ය වූ කල එම ශූන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා පැවතිය යුතු වෛඥානිකත්වයක් විඥානවාදී සම්ප්‍රදාය පෙන්වා දෙයි. මෙසේ මධ්‍යමක දර්ශනය ගරු කරමින් එහි ඉදිරි පියවරක් ලෙස යෝගාචාර විඥානවාදය බිහිවන්නට ඇතැයි සිතිය හැකි ය. මේ ආකාරයට යෝගාචාර විඥානවාදය බිහිවීමෙහිලා මූලික සූත්‍රාගත සහ නිකායාන්තර ඉගැන්වීම් මූල බීජ වශයෙන් සෘජුව බලපා ඇති අයුරු දක්නට ඇත.



## ආන්තික සටහන්

1. විඥප්තිමාත්‍රමේවෛත - දසදර්ථාවභාසනාත්
විඥප්තිමාත්‍රතාසිද්ධිඃ, විංශතිකා කාරිකා, 1 ශ්ලෝකය

2. "විඥානපරිණාමෙ සෞ - පරිණාමඃ ස ච ත්‍රිධා"
"විපාකෝ මනනාඛ්‍යශ්ච - විඥප්තිර් විෂයස්‍ය ච"
විඥප්තිමාත්‍රතාසිද්ධිඃ, ත්‍රිංශතිකා කාරිකා, 1 - 2 ශ්ලෝක

3. විඥප්තිමාත්‍රමේවෛත - දසදර්ථාවභාසනාත්
යථා තෛමීරිකස්‍යාසත් - කේශචන්‍ද්‍රාදි දර්ශනම්
විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිකා, 1 ශ්ලෝකය

4. චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වෙදනා. යං වෙදෙති තං සංජානාති. යං සංජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. තතො නිදානං පුරිසො පපංඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු, ම.නි., 1 මධුපිණ්ඩික සූත්‍රය, බු.ජ.මු, පි. 277

5. න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ - සංකප්ප රාගො පුරිසස්ස කාමො තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ - අථෙත්ථධීරා විනයන්ති ඡන්දං අ.නි., නිබ්බේධික පරියාය සූත්‍රය, බු.ජ.මු, පි. 202

6. චිත්තෙන නීයති ලොකො - චිත්තෙන පරිකස්සති
චිත්තස්ස එක ධම්මස්ස - සබ්බෙව වසමන්වගූ
සං.නි., සගාථාවග්ග, චිත්ත සූත්‍රය, බු.ජ.මු, පි. 72

7. චිත්තංහි වර්තතෙ චිත්තං - චිත්ත මෙව විමුච්‍යතෙ
චිත්තංවිජායතෙනාන්‍ය - චිත්ත මෙව නිරුජ්ඣතෙ
ආර්යලංකාවතර සූත්‍රය

8. ඛු.නි., ධම්මපද පාළි, යමක වග්ග, 1 ගාථාව, බු.ජ.මු, පි. 26

9. ම.නි., පොතලිය සූත්‍රය, බු.ජ.මු, පි. 48

10. ම.නි., මාගන්ධිය සූත්‍රය, බු.ජ.මු, පි. 302

11. තස්‍ය ව්‍යාවෘති අර්හත්වෙ - තදාශ්‍රිත්‍ය ප්‍රවර්තතෙ
විඥප්තිමාත්‍රතාසිද්ධිඃ, ත්‍රිංශතිකාකාරිකා, 5 ශ්ලෝකය

12. භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනංගනෙ විගතුප්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ අනෙඤ්ජප්පත්තෙ

ආසවානං ඛයඤාණාය චිත්තංඅභිනිහරති අභිනාමෙති.......... තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති ඛීණාජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණියං නාපරං ඉත්ථත්තායාති පජානාති
දී.නි., සාමඤ්ඤඵල සූත්‍රය, බු.ජ.මු, පි. 144

13. සර්ව ධර්මාහි ආලිනා විඥානෙ තෙෂු තත්තථා
Stiramath, Ven. Bhattacharya and jucci,G (ed), Abhdharma sutra quoted in maddyanthavibhanga Sutrabhasya tika, part i, (luzac Co.1932) p.28

14. ධර්මාඃ ආලය විඥානෙ ධර්මෙෂුච විඥානං තථා ඵලස්වභාවශ්ච අනොන්‍යම් හේතු ස්වභාව අපි සදා
Vasubandu, Levi ,S (ed), Mahayana, Abhdharmasutta,quoted in vignaptomatratasiddhi by Vasubandu, paris, p.53

15. විරතො කාම සඤ්ඤාය - සබ්බ සංයොජනාතගො නන්දි භව පරික්ඛිණො - සො ගම්භිරෙ න සීදති ඛු.නි., සුත්ත නිපාත, 177 ගාථාව, බු.ජ.මු, පි. 52

16. ආලයරාමා භික්ඛවෙ පජා, ආලයරතා, ආලය සමුදිතා සා තථාගතෙන අනාලයෙ ධම්මෙ දෙසියමානෙ අං.නි., චතුක්ක නිපාතය, දුතිය තථාගත අච්ඡරිය සූත්‍රය, බු.ජ.මු, පි. 252

17. Majjhima Nikaya, Treckueri, V, Chalmer, R (ed), vol. i, p.191

18. Anguthtara Nikaya, moris,R,Hardy and Rhys davids, (ed), vol. ii, p.131

19. තත්‍රාලයාඛ්‍යං විඥානං - විපාකඃ සර්වබීජකම්
විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා, 2 ශ්ලෝකය

20. තෙ ඛිණ බීජා අවිරූල්හිච්ඡන්දා නිබ්බන්ති ධීරා යථායම්පදීපො
සුත්තනිපාතය, රතන සූත්‍රය, 237 ගාථාව, බු.ජ.මු., පි. 72

21. තස්‍ය ව්‍යාවෘති අර්හත්වෙ
විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා, 5 ශ්ලෝකය

22. ක්ලෙශෛශ් චතුර්භිඃ සහිතං - නිවෘතාව්‍යාකෘතං ච තත්
ආත්මදෘෂ්ට්‍යාත්මමොහොත්ම - මානාත්මස්නෙහසංඥිතෛඃ
විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා, 6 ශ්ලෝකය



23. චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වෙදනා. යං වෙදෙති තං සංජානාති. යං සංජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. තතො නිදානං පුරිසො පපංඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු ම.නි., i මධුපිණ්ඩික සූත්‍රය, බු.ජ.මු, පි. 277

24. විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතො පභං
යත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුංථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන - එතේථතං උපරුජ්ඣති
දී.නි., i කේවඩ්ඩ සූත්‍රය, බු.ජ.මු, පි. 538

25. විසුද්ධිමග්ග, (සංස්.), ධම්මානන්ද, එම්, පි. 620

26. අං.නි., තික නිපාතය, බු.ජ.මු, පි. 274

27. අං.නි., හේ.මු, පි. 56

28. විසුද්ධිමග්ග, (සංස්.), ධම්මානන්ද, එම්, පි. 670

29. බුද්ධස්සහි භගවතො ද්විධා දෙසනා සම්මුති දෙසනා පරමත්ථ දෙසනාචාති, මනෝරථපූරණී, හේ.මු., පි. 54

30. තත්ථ පුග්ගලො සත්තො ඉත්ථී පුරිසො ඛත්තියො බ්‍රාහ්මණො දෙවො මාරොති එව රූපා සම්මුති දෙසනා, මනෝරථපූරණී, හේ.මු., පි. 54

31. සංකෙත වචනං සච්චං ලොක සම්මුති කාරණං, මනෝරථපූරණී, හේ.මු., පි. 54

32. අනිච්චං දුක්ඛං අනත්තා ඛන්ධා ධාතු ආයතනානි සතිපට්ඨානානි එව රූපං පරමත්ථ දෙසනා, මනෝරථපූරණී, හේ.මු., පි. 54

33. පරමත්ථ වචනං සච්චං - ධම්මානං භූත කාරණං, මනෝරථපූරණී, හේ.මු., පි. 54

34. ආත්මධර්මොපචාරොහි - විවිධො යඃ ප්‍රවර්තතෙ
විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා, 1ශ්ලෝකය

35. අවිච්ඡෙදප්පවත්ති හෙතුභාවෙන භවස්ස අංගන්ති භවංගං, අභිධම්මත්ථවිකාසිනී, (සංස්.), බුද්ධදත්ත හිමි, පි. 87

36. ගංගා සොතාවිය වෙගෙන ජවමානා භවංග සන්තති අන්තරා වොච්ඡිජ්ජමානාපි, අභිධම්මත්ථවිකාසිනී ටීකා, පි. 194

37. පටිසන්ධි විඤ්ඤාණෙ පන නිරුද්ධෙ තං පටිසන්ධි විඤ්ඤාණමනුබද්ධමානං තස්ස තස්සෙව කම්මස්ස විපාකභූතං තස්මිං යෙව ආරම්මණෙ තාදිසමෙව භවංග විඤ්ඤාණං නාම පවත්තති, විසුද්ධිමග්ග, (සංස්.) ධම්මානන්ද, එම්, පි. 356

38. අත්ථි පුග්ගලො අත්තහිතාය පටිපන්නො, දී.නි., පාථික වග්ග, සඞ්ගීති සූත්‍රය, බු.ජ.මු, පි. 392, එක පුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජන හිතාය සුඛාය ලොකානුකම්පකාය ම.නි., මූලපණ්ණාස අට්ඨකථා කතමො භික්ඛවෙ භාරො. පඤ්චුපාදානක්ඛන්ධාතිස්සවචනීයං. කතමො පඤ්ච? සෙය්‍යථීදං. රූපූපාදානක්ඛන්ධො..... අයං වුච්චති භික්ඛවෙ භාරො. කතමො භික්ඛවෙ භාරහාරො පුග්ගලොතිස්ස වචනීයං. යොයං ආයස්මා එවං නාමො එවං ගොත්තො අයං වුච්චති භික්ඛවෙ භාරහාරො, සං.නි., iii භාරහාර සූත්‍රය, බු.ජ.මු, පි. 25

39. සර්වං සර්දා අස්තීති සර්වාස්තිවාදඃ මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, ආරිය ප්‍රකාශන, වරකාපොල, 1998, පි. 36

40. ස්වභාව සාමාන්‍ය ලක්‍ෂණං ධාරෙතීති ධර්මාඃ මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, ආරිය ප්‍රකාශන, වරකාපොල, 1998, පි. 37

41. යෙ සූත්‍ර ප්‍රමාණිකා නතු ශාස්ත්‍ර ප්‍රමාණිකා තෙ සෞත්‍රාන්තිකාර්ථඃ නානායක්කාර, සනත්, මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003, පි.76

42. අනිච්චාවත සංඛාරා උප්පාද වය ධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසංවූපසමොසුඛො
දී.නි., මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.මු, පි. 246 උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති දී.නි., මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.මු, පි. 246 සමුදය ධම්මානුපස්සි විහරති වය ධම්මානුපස්සි විහරති සං.නි., මහාවග්ග පාළි, සතිපට්ඨාන සූත්‍රය, බු.ජ.මු, පි. 210

43. ක්‍ෂණිකානාං නාස්ති දෙශාන්තර ගමනං යත්‍රෛව උප්පත්ති තත්‍රෛව විනාශං නානායක්කාර, සනත්, මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003, පි. 65



44. යඃ ප්‍රතීත්‍යසමුත්පාදඃ ශූන්‍යතාං තාං ප්‍රචක්‍ෂ්මහෙ යා ප්‍රඥප්තිරුපාදාය ප්‍රතිපත්සෛව මධ්‍යමා, මූලමාධ්‍යමික කාරිකා. ආර්යසත්‍ය පරීක්‍ෂා ප්‍රකරණ, 18 ශ්ලෝකය

45. සර්වෙභාවාඃ ස්වභාවෙන ප්‍රතිබිම්බ සමාමතාඃ නාගාර්ජුන හිමි, මූල මාධ්‍යමික කාරිකා, (සංස්.), සාසනරතන හිමි, මොරටුවේ, පී. ජේ. රුද්‍රිගෝ, පානදුර, 1963, පි. 65

46. යථා මායා යථා ස්වප්නො - ගන්ධර්ව නගරං යථා තථොත්පාදස්තථා ස්ථානං - තථා භඞග උදාහෘතම්, මූලමාධ්‍යමික කාරිකා . සංස්කෘත පරීක්‍ෂා ප්‍රකරණ, 34 ශ්ලෝකය